මාධ්‍ය නිවේදනය
සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477669 +94 11 2346304
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

නිකුත් කළේ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව
දිනය 2024 මැයි 15

**2024 මැයි 13 වන දින පවත්වන ලද භාණ්ඩාගාර බැඳුම්කර නිකුතුව**

2024 මැයි මස 13 දින පවත්වන ලද භාණ්ඩාගාර බැඳුම්කර වෙන්දේසියේදී සුරැකුම්පත් හඳුනා ගැනීමේ ජාත්‍යන්තර අංක වන LKB01528E016, LKB00730J158 සහ LKB02032J017 දරන භාණ්ඩාගාර බැඳුම්කර සඳහා සෘජු නිකුතු කවුළුව ඔස්සේ ලද රුපියල් මිලියන 62,555ක මුළු ලංසු ප්‍රමාණය අතුරින්, පිළිගත හැකි උපරිම වටිනාකම වන රුපියල් මිලියන 7,000ක්, (රුපියල් මිලියන 1,500ක්, රුපියල් මිලියන 2,500ක් සහ රුපියල් මිලියන 3,000ක් බැගින්), එම වෙන්දේසියේදී අදාළ සුරැකුම්පත් කාණ්ඩ සඳහා තීරණය කරන ලද බර තබන ලද සාමාන්‍ය ඵලදා අනුපාතික වන පිළිවෙලින්, 11.01%, 11.85% සහ 12.17% යටත්ව පිළිගන්නා ලදී.

ඉහත නිකුතුව සඳහා ගෙවීම් කළ යුතු දිනය 2024 මැයි 15 වේ.